# දහම් පාසල් අවසාන පෙරහුරු විභාගය

කාලය පැය 3

උපදෙස් ඃ පිලිතුරු ලිවීමේදි වෙනත් කොළයක් භාවිතා කරන්න.**සෑම ප්‍රශ්නයකටම** පිළිතුරු ලියන්න.

**( 1 කොටස )(1 පාඩමේ සිට 18 පාඩම/අභිධර්මය 1 හා 2 පාඩම් වලින් සකස් කර ඇත.)**

---

1. අංගුලිමාල දමනයෙන් ප්‍රකට වන බුදුගුණය නම් කරන්න.
2. බුදුරජානන් වහන්සේ කිසිදු ආයුධයක් නොමැතිව දරුණු පුද්ගලයින් දමනය කළේ කුමන ගුණ මහිමයෙන්ද?
3. අංගුලිමාලගේ පියා හා මව නම් කරන්න.ඔහුගේ කුඩාකළ නම කුමක්ද?
4. අංගුලිමාල ලෙස ප්‍රකට වුයේ කුමන කරුණක් නිසා දැයි සැකෙවින් ලියන්න.
5. ආර්යාවෙනි මා සිවුරු නොහරවන්න.මම දෙව්දත් තෙරුන් උදෙසා පැවිදි නොවෙමි .මෙසේ ප්‍රකාශ කළේ කවුද?
6. උපාලි තෙරුන් හට ලබා දුන් තනතුර කුමක්ද? සමගියේ අගය පිළිබඳ පෙන්වා දෙන ජාතක කථාව කුමක්ද?
7 .කුමාරකාශ්‍යප මාතාවගේ නිර්දෝශිභාවය සදහා ප්‍රකාශ කිරීමට ක්‍රියාකලෝ කවුරුන්ද?
8. විශාඛා මහ උපාසිකාව උපාලි තෙරණුවන්ට දැන්වුයේ කුමක්ද?
9. අනුන්ගේ ආකෝස පරිභව කිරීම් ආදිය කෙරෙහි කෝප නොවන ඉවසන සුලු තැනැත්තා බ්‍රහ්මණයෙකැයි මම කියමි.බුදුරජානන්වහන්සේ මෙසේ වදාළේ කාටද?තුන්වැදෑරුම් දුක් නම් කරන්න.
10. ගෞතමයනි කුමක් නැසීමෙන් සුවසේ කල්ගෙවිය හැකිද?නැසිය යුතු එකම ධර්මය කුමක්ද? යනුවෙන් වදාළේ කවුද?බුදුරජානන් වහන්සේ සමඟ සිවුරු හුවමාරු කරගත් තෙරනුවෝ කවුරුන්ද?
11. අකෝස භාරද්වාජ මහත් සේ කෝපයට පැමිණ බුදුරජානන්වහන්සේ වෙත පැමින අසභ්‍ය වචනයෙන් බනින්නට විය.බැණ අවසන් වන තෙක් නිහඬව සිටීමෙන් බුදුරජානන්වහන්සේගේ කුමන ගුණය ඉස්මතු වන්නේද?
12. මහා කාශ්‍යප මහරහතන් වහන්සේට හිමි වු අගතනතුර වන්නේ කුමක්ද?
13. අල්පේච්ච ගුණයෙන් ඔපවත් වු තෙරුන් වහන්සේ කවුද?බුද්ධදාස රජතුමාගේ පියා කවුද?
14. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ගේ ජන්ම භුමිය/පියා/මව/ගිහි කළ නම කුමක්ද?
15. මහාරහතන් වහන්සේගෙන් බුදුසසුනේ චිරස්ථිතිය සදහා සිදුවු සේවය පහදන්න.?
16. පිප්පලි කුමරු සරණ පාවා ගත්තේ කවුරුන්ද?බුදුරජානන් වහන්සේ මුණ ගැසීමට පැමිනි පිප්ඵලි කුමරුට අවධානය යොමු කරවමින් අනුශාසනා කලේ කුමක්ද? තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ග්‍රන්ථයක් නම් කරන්න
17. මහාකාශ්‍යප තෙරනුවන් දැරූ තනතුරු 3ක් ලියන්න?ලෝක පාලක ධර්ම හෙවත් දේව ධර්ම යනු මොනවාද?
18. සුහදශීලිව කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දුන් අවස්ථා කිහිපයක් පෙන්වා දෙන්න?
19. භද්දකාපිලානි කුමරිය පැවිද්ද ලැබුවේ කාගේ අසපුවට ගොස්ද?
20. මහාප්‍රජාපති ගෝතමී දේවිය සමඟ පැවිද්ද ලබා සිටි තෙරණිවරුන්ට නන්ද තෙරනුවන් විසින් දේශනා කරන ලද

සූත්‍රය කුමක්ද? අෂ්ඨ සමාපත්තිය නම් කරන්න.ගුණානන්ද හිමියන්ගේ ප්‍රසිද්ධ පුවත්පත් 4 ක් ලියන්න.

21. මහාප්‍රජාපති ගෝතමී දේවියට උපසම්පදාව දෙන ලද්දේ ගරුධර්ම කිහිපයක් පිළිගන්නේ නම් පමණයි. බුදුරජානන් වහන්සේ වදාළහ. එම ගරු ධර්ම කියද? ගරුධර්ම ලියා දක්වන්න.

22. මහාප්‍රජාපති ගෝතමී දේවිය වෙත බුදුරජානන් වහන්සේ විසින් පිරිනමන ලද තනතුර කුමක්ද?

23. මහාප්‍රජාපති ගෝතමියගේ චරිතයෙහි දක්නට ඇති විශේෂ ගුණාංග කවරේද?

24. මහාප්‍රජාපති ගෝතමී තෙරණියගේ චරිතයෙන් කාන්තා සමාජයට ගතහැකි ආදර්ශ කවරේද?

25. මහාප්‍රජාපති ගෝතමියගේ චරිතයෙන් ශාසනයට සිදු වූ සේවාව කවරේද?

26. ශාක්‍ය-කෝලිය වංශිකයන් කොපමණ සංඛ්‍යාවක් සසුන් ගතවූයේද?ශෝභන චෛතසික 5ක් නම් කරන්න.

27. රූපනන්ද ආදි එම කුමාරිකාවන් ද කැටුව මහා ප්‍රජාපති ගෝතමී බුදුරජානන්වහන්සේ හමුවීමට ගියේ කොහේටද?

28. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපානන් වහන්සේ කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළේ කුමන වර්ෂයේද? ධාතුසේන රජතුමා විසින් ඉදිකරවූ අගනාම නිර්මාණ දෙකක් නම් කරන්න

29. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපානන් වහන්සේගෙන් සිදුවූ ධර්ම ශාස්ත්‍ර සේවාව කුමක්ද?

30. පෙමතො ජායති සොකො........ යන ගාථාපාඨය සම්පූර්ණ කරන්න.එහි තේරුම ලියන්න.

31. යෙ ධම්මා හේතුප්පභවා........ යන ගාථාපාඨය සම්පූර්ණ කරන්න.එහි තේරුම ලියන්න.

32. ශ්‍රී ධර්මාලෝක හිමියන්ගේ චරිතය පිළිබඳ කෙටියෙන් පහදන්න.අකුසල චෛතසික 5 ක් නම් කරන්න.

33.1. කෙටි සටහන් ලියන්න. 11.අශෝක රජතුමාගේ ධර්ම ලිපි වල සඳහන් ශ්‍රේෂ්ඨ කියමන් 3 ක් ලියන්න.
බුද්ධදාස රජතුමා/මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්/වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමියන්/ජීවක වෛද්‍යවරයා/අශෝක රජතුමා/ධාතුසේන රජතුමා/හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා/සුනිත/සෝපාක/සැරියුත්-මුගලන් දෙනම/චතුරාර්යය සත්‍යය

34. තුන්වැනි ධර්ම සංගයනාවේ ප්‍රධාන දායකයා වූයේ (රාජ්‍ය අනුග්‍රහය) කවුද?

35. රාජගුරු යන ගෞරව නාමය ලැබුවේ කවුරුන්ද?ප්‍රථම ආරාම පූජාව සිදුකළේ කවුරුන්ද?කුමක්ද?

36. බුදුරජානන් වහන්සේගේ මුල්ම ශ්‍රාවකයින් වහන්සේලා හැටනම නම් කරන්න.චතුරාර්යය සත්‍ය නම් කරන්න.

37. කලා වැව කරවූයේ කවුරුන්ද?දේව ධර්ම යනු පැහැදිලි කර දුන්නේ කවුරුන්ද?

( 11 කොටස )(19 පාඩමේ සිට 32 පාඩම/අභිධර්මය 3/4/5 පාඩම් හා පාලි කොටස් වලින් සකස් කර ඇත.)

38. ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිවලින් නම් කරන්න.රතන සූත්‍රයේ අඩංගු වන්නේ කුමන ගුණයන්ද?

39. බුදුරජාණන් වහන්සේ විසින් රතන සූත්‍රය දේශනා කරන ලද්දේ කොහේදිද?කා සදහාද?

40. ලෝකෝපකාරය නම් පද්‍ය ග්‍රන්ථයේ කතුවරයා කවුද?

41. සංසාරයේ සත්වයා බැද තබන බැම් දහයක් ගැන සදහන් වේ.එම බැම් දහය නම්කර ඇත්තේ කුමන නමින්ද? එම බැම් 10 ලියා විස්තර කරන්න.

42. තමාගේ සිහි නුවණ දුර්වල විමටත් තමන් උගත් දේ පාඩම් කළ දේ අමතක විමටත් හේතුවන අකුසල ධර්ම සමුහයක් ගැන දහමේ ඉගැන්වේ.ඒවා හැදින්වෙන්නේ කුමන නමින්ද?ඒවා මොනවාදැයි ලියා විස්තර කරන්න.

43. රුක්ඛො යන පාලි වචනයේ බහුවචන රූපය නම් කරන්න.

44. මානය පිලිබද බුදුදහමේ එන ඉගැන්විම් අනුව තමන් අනයයන් හා සමාන යැයි සිතිම කිනම් මානයක්දැයි ලියන්න.

45. කවියෙන් දෙසූ බණ නම් පාඩම සදහා උපුටාගත් පද්‍ය ඇතුළත් කව්පොත සහ එහි රචකයා පිලිබද කෙටියෙන් හදුන්වා දෙන්න. නහි වේරේන වේරානි යන ගාථාව තේරුම සමඟ පැහැදිලි කරන්න.

46. “කෙතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර“ පද්‍ය පාඨය ඇතුළත් කවිය සම්පූර්ණ කරන්න.එම පද්‍යයෙන් ලබා දෙන

උපදේශය කෙටියෙන් පැහැදිලි කරන්න.

47. සිඟාල ගෘහපතියාට බුදුරජානන් වහන්සේ විසින් පෙන්වා දෙන සදිසා නම් කරන්න.දේශනා කරන ලද සූත්‍රය කුමක්ද?ජය ශ්‍රී මහා බෝ සමිදුන්ගේ දක්ෂිණ ශාඛාවක් ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ කවුරුන්ද?

48. ඉහත සූත්‍රයේ සදහන් පරිදි ගුරු-ශිෂ්‍ය යුතුකම් හේතුවන අන්දම කෙටියෙන් විමසිමට ලක් කරන්න.

49. කලයාණ මිත්‍රයන් ඇසුරු කිරිමේ අගය ඔබේ අත්දැකිම් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

50. පාලි වාක්‍ය සිංහලයට නගන්න.

1.වනිතා දාරිකාය සහ ධම්මං සුණාති.

11.උපාසිකා භික්ඛූනං දානං දෙන්ති.

111.අහං රථෙන විහාරං උපාසංකමාමි.

1V.මයං ආහාරෙහි ජිවාමි.

51. සිංහල වාක්‍ය පිලියට නගන්න.

1.මම දහම් පාසල් යමි.

11.මව දියණිය සමඟ බණ අසයි.

111.අපි ශිෂ්‍යයින් සමඟ පන්සල් යමු.

1V.නුඹලා පොරවෙන් ගස කපව.

52. මෙම ක්‍රියාපද වල බහුවචන ලියන්න. පූජේමි/රෝදති/ද දාති/පිබති/දේසේති/සුණාති/වන්දති/පූජේති/ගම්ස්සති

53. නිවරණ යන්නෙහි අරුත පැහැදිලි කරන්න.පංච නිවරණ කෙටියෙන් හදුන්වා දෙන්න.පංච නිවරණ ශිෂ්‍යයකුගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි බාධක වන අන්දම පැහැදිලි කරන්න.

54. තමා තුළ ඇති වැරදි අඩුපාඩුකම් දැක පවා තමාට කියා දෙන කලයාන මිත්‍රයාව තේරුම් ගත යුත්තේ නිධානයක් පෙන්වා දෙන අයෙකු ලෙස යැයි දහමේ ඉගැනිවේ.එම අදහස ඇතුළත් වන්නේ කමන ධම්මපද ගාථාවේද?

55. බුදුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද අන්ත දෙක කෙටියෙන් හඳුන්වා දෙන්න.

56. "ගජකුම් බිඳින" ආදි පද්‍යය සම්පූර්ණ කර ලියන්න.එම පද්‍යයේ අදහස ලියා දක්වන්න.

57. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහිලා නිවැරදි ක්‍රියා යනුවෙන් අර්ථ දැක්වෙන මාර්ග අංගය නම් කරන්න.

58. පංච නිවරණ අතුරෙන් සුලං පහර වැදී සෙලවෙන කෙඩියකට උපමා කර ඇත්තේ කුමක්ද?

59. "තමාගේ දුබලතා පෙන්වා දෙමින් යහපත සඳහා උපදෙස් දෙන මිතුරන්ම ඇසුරු කරන්න."යන ආදර්ශය ඇතුලත්
ධම්මපද ගාථාව නම් කරන්න.

60. සිඟාලෝවාද සූත්‍රයෙහිලා දකුණු දිසාව ලෙස හඳුන්වා ඇත්තේ කා උදෙසාද?

61. පිරිනිවන් පෑමට ආසන්න අවස්ථාවේදී දහම් ඇසීමට පැමිනි සුභද්ද පිරිවැජියා අමතා පැවසුවේ කුමක්ද?

62. දස සංයෝජනයන්හි ඔරම්භාගිය සංයෝජන 5 හා උද්ධම්භාගිය සංයෝජන 5 වශයෙන් වර්ග කර දක්වන්න.

63. ලෝවැඩ සඟරාව රචනා කරනු ලද්දේ කවුරුන් විසින්ද?

64. සිංහල බෞද්ධ සාහිත්‍යයේ එන උපදේශ කාව්‍ය අතර ප්‍රමුකස්ථානයක් ගන්නා කෘතින් 3 ක් ලියන්න.

65. සුභාෂිතය/ලෝකෝපකාරය යන කාව්‍ය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

66. දස අකුසල් කය/සිත/වචනය යන ශිර්ෂ ඔස්සේ බෙදා දක්වන්න.

67. ප්‍රාණඝාත අකුසලය සිදුවීමට බලපාන අංග 5 නම් කරන්න.

68. දොළොස් පුණ්‍යක්‍රියා නම් කරන්න.පින් කිරියවත්(කාව්‍යශේකරය)යෙහි සඳහන් භාවනා වර්ග දෙක නම් කරන්න.

69. ත්‍රිපිටකය නම් කරන්න. කාව්‍යශේකරය රචනා කරන ලද්දේ කවුරුවන් විසින්ද?

70. මෛත්‍රී භාවනාවෙන් උගන්වනු ලබන්නේ කුමක්ද?

71. "කය නම් අසාරය - බව නම් භයංකාරය" යන කාව්‍ය ඇතුළත් ග්‍රන්ථය වන්නේ කුමක්ද?

72. ශ්‍රද්ධාව යනු කුමක්ද? "ඔවා දෙනු පරහට -තමා සම්මතයේ පිහිට සිට" යන කවිය අන්තර්ගත වන්නේ කුමන ග්‍රන්ථයේද?

73. ආරක්ෂක පිරිත ලෙස සලකන්නේ කුමන සූත්‍රයද?බුදුරදුන් අභිධර්මය දේශනා කරන ලද්දේ කා හටද?

74. සිංහල බෞද්ධයින් සතුව ඇති ඉපැරණි පාරිභෝගික වස්තුව වන්නේ කුමක්ද?

http://edulanka.com

සිරිලක අන්තර්ජාල තක්සලාව